**මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013**

-------------------------------------------------------------------------------------

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රජය ( ශ්‍රී.ලං.ර.) සහ අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන බැංකුව (අ.ස.ජ.බැ.) අතර 2012 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - 105 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

ණය ගිවිසුමට අනුව මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සහ නැගෙනහිර වයඹ, මධ්‍යම සහ සබරගමුව පළාත් සහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සෞඛ්‍ය හා ඖෂධ වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා ද්විතීය මට්ටමේ රෝහල්වල පහසුකම් හා උපකරණ වැඩි දියුණු කිරීම තුළින් අත්‍යවශ්‍ය බෙහෙත් නිෂ්පාදන ධාරිතාව සවිබල ගැන්වීම හා බෝ නොවන රෝග කළමනාකරණය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 4,760 ක වටිනාකමට සමාන රු. මිලියන 6,332 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 3,935 ක වටිනාකමට සමාන රු.මිලියන 5,155 ක් හෝ සියයට 83 ක් අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන බැංකුව (අ.ස.ජ.බැ.) විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 23 දින ආරම්භ කළ අතර 2019 ජූලි 23 දිනට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද

විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 351,331,306 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 357,127,769 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් කාලය සඳහා ව්‍යාපෘති වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් අයිතමය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස හයක කාලය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 172,956,291 | - | 172,956,291 |
| මිලදී ගැනීම්-සෞඛ්‍ය අමාත්‍යාංශය | 112,651,397 | - | 112,651,397 |
| උපදේශන සේවා | 33,538,382 | - | 33,538,382 |
| ගිවිසුම් ගාස්තු | 2,633,547 | - | 2,633,547 |
| පොලී | 12,563 | - | 12,563 |
| පරිපාලන පිරිවැය | 29,539,126 | 5,796,463 | 35,335,589 |
| **එකතුව** | **351,331,306** | **5,796,463** | **357,127,769** |

## 5. විගණන නිරීක්ෂණ

**නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

අ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව, වටිනාකම රු. 2,017,049ක් වූ වත්කම්වල පැවැත්ම තහවුරු කිරීමට හැකිවන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

ආ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින්ගේ දළ වැටුප වෙනුවට මූලික වැටුප පදනම් කරගෙන සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකත්වයන් ගණනය තිබූ බව නිරීක්ෂණය විය.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ලබාදීමට එකඟ වූ වටිනාකම | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | |
|---|---|---|---|---|---|---|---|
| | ----------------- | | ------------- | ----------------------- | | ---------------- | |
| | ජ.යෙ. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජ.යෙ. (මිලියන) | රු. (මිලියන) | ජ.යෙ. (මිලියන) | රු. (මිලියන) |
| අ.ස.ජ.බැ. | 3,935 | 5,155 | 507 | 248 | 322 | 248 | 322 |
| ශ්‍රී.ලං.ර | 825 | 1,177 | 120 | 3 | 30 | 4 | 35 |
| | ------- | ----- | ------- | ------ | ----- | ------ | ------ |
| එකතුව | 4,760 | 6,332 | 627 | 251 | 352 | 252 | 357 |

ණය පියවීමේ උපලේඛනයට අනුව, වසර 2012 සිට 2019 දක්වා අවුරුදු හයක් තුළ ජපන් යෙන් මිලියන 3,935 ක වටිනාකමට සමාන රු. මිලියන 5,155 ක් උපයෝජනය කිරීමට බලාපොරොත්තු වූ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් 2013 වර්ෂය සඳහා රු. මිලියන 507 ක් ව්‍යාපෘතිය වෙත ප්‍රතිපාදන ලබාදී තිබුණි. ඉන් 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ජපන් යෙන් මිලියන 248 ක වටිනාකමට සමාන රු. මිලියන 322 ක් හෝ ලබාදී තිබූ අරමුදලින් සියයට 15 ක් උපයෝජනයකර තිබුණි.

## 6.2 භෞතික කාර්යසාධනය

ඉදිරිපත්කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී කුලවන්චිකුඩි, වරකාපොල හා ගලගමුව මූලික රෝහල් තුනක ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ආරම්භකර තිබුණි. එසේම, ව්‍යාපෘතියේ මූලික ඉදිකිරීම් වැඩසටහන අනුව, ගිලන්රථ 124 ක් ප්‍රසම්පාදනය කිරීමට බලාපොරොත්තු වූ අතර ඒ සඳහා රු. මිලියන 602 ක වටිනාකමට සමාන ජපාන යෙන් මිලියන 464 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. කෙසේවෙතත්, 2014 මැයි 31 දින වනවිටත් ගිලන්රථ 86 ක් පමණක් ප්‍රසම්පාදනකර තිබුණි.